# ජනතා සේවක පක්ෂයේ ව්‍යවස්ථාව

**01. නාමය** - ජනතා සේවක පක්ෂය

**02. මූලික කරුණු** - මැතිවරණ ලකුණ ගිටාරය වන අතර වර්ණය රන්වන් පැහැය සහ ධජය පළල මෙන් 1.6 ගුණයක් දිග රන් පැහැ පසුබිමෙහි හරි මැද රතු තරුවක් සහිත ධජයකි.

**03. පක්ෂ අනන්‍යතාව**

(අ) ජනතා සේවක පක්ෂය ශ්‍රී ලංකාවේ දේශපාලන පක්ෂයකි. එය මෙස මානවක සම්ප්‍රදායට නව ජීවයක් ලබාදීම පිණිස ස්වේච්ඡා පදනමේ පිහිටා නිස්සරණාධ්‍යාශයෙන් ජාතික හා ජාත්‍යන්තර දේශපාලන කටයුතු වල නිරත වෙමින් ජනතා පරමාධිපත්‍යය මත පදනම්වුනු, ජනතා පරමාධිපත්‍යය සක්‍රියව බලගැන්වෙන පාලන ක්‍රමවේදයක් සහ පාලන තන්ත්‍රයක් ස්ථාපිත කිරීම පිණිස කැප වේ.

(ආ) ජනතා සේවක පක්ෂය ශ්‍රී ලංකා භූමිය මත පොදු ජනතා ප්‍රජාතන්ත්‍රවාදය හා සමාජ සාධාරණය ස්ථාපිත කිරීම පිණිස සංවිධානය වන, ප්‍රචාරක කටයුතු කරන, උද්ඝෝෂණ කරන, සාමාකාමීව සටන් වදින, මූළධර්මවාදයන් මුළුමනින් ම ප්‍රතික්ෂේප කරන දේශපාලන පක්ෂයකි.

(ඇ) ශ්‍රී ලංකාව මුහුණ දී ඇති වර්තමාන අර්බුදයට එකම විසඳුම වන්නේ ශ්‍රී ලංකාවේ සංස්කෘතික අනන්‍යතාව සහ ජාතික ආර්ථික වැඩ පිළිවෙලක් මත පිහිටා කරනු ලබන ජාතික විමුක්ති අරගලය ජයග්‍රහණය කිරීම බව ජනතා සේවක පක්ෂය විශ්වාස කරයි.

**04. ජනතා සේවක පක්ෂයේ මූලික අරමුණු**

(අ) ජනතාවගේ පරමාධිපත්‍යය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන්ම තහවුරු කරන ඒකීය රාජ්‍ය ව්‍යුහයක් යටතේ රාජ්‍ය පාලනය ස්ථාපිත කිරීම

(ආ) මේ වන විට මානව ක්‍රියාකාරීත්වය නිසා සමස්ත ජෛව ගෝලයම පත්ව ඇති අන්තරාය වෙනස් කර, මිහිතලය මත පරිණාමය වූ සියළුම ජීවීන් මිහිතලයේ පැවැත්මට අනුගාමී වන මානව සංවර්ධනයක් සහිත සමාජයක් බිහි කිරීම

(ඇ) රටේ සියළු සම්පත් රටේ ජනතාවගේ යහපත වෙනුවෙන් පළමුවත් ලෝක ජනතාවගේ යහපත වෙනුවෙන් දෙවනුවත් උපයෝගී කරගන්නා, "ජාතික සම්පත් ජාතික අයිතිය වේ" යන තේමාව පෙරදැරි කරගත් ප්‍රතිපත්තියකට අනුව සම්පත් කළමනාකරණ කිරීම

(ඈ) ප්‍රජාතන්ත්‍රවාදය සහ සමාජ සාධාරණත්වය ස්ථාපිත කරමින් ශ්‍රී ලංකාව දියුණු රාජ්‍යයක් බවට පත් කිරීම

(ඉ) ආහාර සුරක්ෂිතතාව සහ ආහාර විවිධත්වය යනු හුදු කුසගින්න ඉලක්ක කරගත් කියාදාමයක් පමණක් නොව, සෞඛ්‍යයමය, ආර්ථිකමය, අධ්‍යාපනික, සංස්කෘතික සහ ජාතික ආරක්ෂාවත් සමාජ ස්ථායිතාවයත් ඇතිකරන අත්‍යාවශ්‍ය අංගයක් බව පිළිගැනීම

(ඊ) ජාතික ආරක්ෂාව ස්ථාපිත කිරීමේ ආර්ථිකමය මාර්ගය බවට ජාතික ආර්ථිකය ගොඩනැගීම පිළිගැනීම

(ඌ) ජාතික ආරක්ෂාව භූගෝලීය වශයෙන් පමණක් නොව නව ඩිජිටල්, නැනෝ සහ න්‍යෂ්ටික උපමාන ඔස්සේ ද සහතික කිරීම සහ ජාතික ආරක්ෂාවේ අයිතිය සමස්ත විශ්වීය ක්‍රියාකාරකම හමුවේ තහවුරු කෙරෙන නීතිමය ප්‍රතිපාදන ඇතිකිරීම

(ඌෟ) අප රටක් ලෙස අන් රටවලට වැදගත් වන සහ නැතුව බැරි රාජ්‍යයක් බවට පත්වීම සහ ඒ අනුව වඩාත් පාරදෘශ්‍ය නොබැඳි පිලිවෙතක් ඔස්සේ ජාත්‍යන්තර රාජ්‍යයන් සහ සංවිධාන කළමනාකරණය කිරීම සහ එම ප්‍රතිපත්තිය මත පිහිටමින් ආර්ථික සංවර්ධනයේ ජාතික සහ අන්තර්ජාතික ඉලක්ක සපුරාගැනීම

(එ) රටත් ජනතාවත්, දේශියවත් ජාත්‍යන්තරවත් ඉහත ප්‍රතිපත්තීන්ට එරෙහිව බැඳතබන ගිවිසුම්, එකගතා සහ අනපණත් අතීතයට බලපාන පරිදි අධ්‍යයනය කර ඒවාට අවශ්‍ය සංශෝධන, යළි සළකාබැලීම් සහ අවශ්‍ය වන අවස්ථාවලදී අවලංගු කිරීමේ පියවරයන්ට රාජ්‍ය තාන්ත්‍රිකව එලඹීම

මෙම අරමුණු දේශිය වශයෙන් හා ජාත්‍යන්තර වශයෙන් සාක්ෂාත් කර ගැනිම සඳහා ජාතික හා ජාත්‍යන්තර වශයෙන් සියළු ප්‍රගතිශීලි ජනතාව සංවිධානාත්මකව ඒකාරාශි කොට ක්‍රියාත්මක වීම සඳහා ජනතා සේවක **පක්ෂය** නායකත්වය ලබා දෙනු ඇත.

## 05.සාමාජිකත්වය

ජනතා සේවක පක්ෂයේ **සාමාජිකත්වය,** සඳහා මෙම ව්‍යවස්ථාවේ **ඇමුණුම 1** ලෙස දක්වා ඇති සාමාජික අයදුම්පත පක්ෂයේ කවර හෝ අනු සංවිධානයක් හරහා පක්ෂයේ මධ්‍යම කාරක සභාව වෙත යොමු කිරීමෙන් සාමාජිකත්වය සඳහා අයදුම් කළ හැකිය. පක්ෂයේ සාමාජිකත්වය සම්බන්ධයෙන් කරනු ලබන සෑම ඉල්ලීමකටම අදාලව පක්ෂ මධ්‍යම කාරක සභාවේ තීරණය අවසන් තීරණය වේ.

### 5.1 පුද්ගල සාමාජිකත්වය

ශ්‍රී ලංකාවේ පුරවැසියකු වන සහ ඡන්ද බලය හිමි පුද්ගලයකු විසින් සාමාජික ඉල්ලුම්පත්‍රයක් ඉදිරිපත් කර එයට පක්ෂ මධ්‍යම කාරක සභාවේ අනුමැතිය ලැබුනු පසු රුපියල් සියය(රු.100/-)ක සාමාජික ගාස්තුව ගෙවන ලද සාමාජිකයන් පුද්ගල සාමාජිකයන් වශයෙන් සලකනු ලැබේ.

මෙම සාමාජිකත්වය යාවජීව සාමාජිකත්වයක් වන අතර පහත දැක්වෙන කවර හෝ ප්‍රතිපාදනයන් ක්‍රියාත්මක කිරීමේ ප්‍රතිඵලයක් ලෙස අහිමි කරන ලදහොත් හෝ ඉල්ලා අස්වුවහොත් හෝ සාමාජිකයාගේ මරණයෙන් හෝ මිස අවසන් නොවන්නේ ය. ඉහත කී පරිදි සාමාජිකත්වය අවසන් නොවූ සහ පක්ෂ මධ්‍යම කාරක සභාව විසින් සාමාජිකත්වය අත්හිටුවා නැති කවර හෝ සාමාජිකයෙකු පක්ෂයේ වාර්ෂික මහා සභා සම්මෙලනයේදී සහ විශේෂ මහා සම්මෙලනයකදී ද ඔහු නියෝජනය කරන කවර හෝ කමිටුවකදී ද ශාඛා සංවිධානයකදී ද ඡන්දය දීමට සුදුස්සෙකුද වන්නේ ය.

මෙම සාමාජිකයන් පක්ෂයේ සාමාජික මුදලට අමතරව රුපියල් දහස(රු.1000/-)ක වාර්ෂික දායක මුදලක්ද ගෙවියයුතු අතර අදාල දිනට පෙර වාර්ෂික පක්ෂ දායක මුදල නොගෙවීම, නිරනුමානයෙන්ම 5.6.1 වගන්තිය යටතේ පක්ෂ සාමාජිකත්වය අහෝසි වීමට හේතුවක් විය හැකිය. මේ සම්බන්ධයෙන් පක්ෂ මධ්‍යම කාරක සභාවේ තීරණය අවසන් තීරණය වේ.

මධ්‍යම කාරක සභාව විසින් යම් පුද්ගල සාමාජිකත්ව අයදුම්පතක් පිළිගත් පසු සාමාජිකත්වය ලබාගැනීමේදී ගෙවිය යුතු බවට මධ්‍යම කාරක සභාව විසින් නියම කරන ලද යාවජීව සාමාජික ගාස්තුව ගෙවා, "අදාල සාමාජිකත්වය පිරිනැමීම එම පුද්ගලයා විසින් පිලිගත් බවට" ලිඛිත දැනුම්දීමක්, නියම කරන ලද දින හෝ ඊට පෙර මධ්‍යම කාරක සභාවට එවිය යුතුය. දෙන ලද කාලය තුළ අදාල සාමාජික ගාස්තුව නොගෙවන ලද හෝ "අදාල සාමාජිකත්වය පිරිනැමීම එම පුද්ගලයා විසින් පිලිගත් බවට" වන

ලිඛිත දැනුම්දීම ඉදිරිපත් නොකරන පුද්ගලයන් වෙනුවෙන් මධ්‍යම කාරක සභාව ලබාදුන් අනුමැතිය, අදාල දිනය ඉක්මයාමෙන් පසු අහෝසි ව යන්නේ ය. එසී අහෝසි වීම, යළි සාමාජිකත්වය සඳහා ඉල්ලුම් කිරීමට බාධාවක් නොවන්නේය.

**5.2 පක්ෂයේ සාමාජිකත්ව ලේඛණය**

සෑම ජාතික මහා සම්මේලනයකටම පසු යාවත්කාලීන කරන ලද සාමාජිකත්ව ලේඛණය මැතිවරණ කොමිසම වෙත යැවීම ලේකම්වරයා විසින් ඉටුකළ යුතුය. එතැන් පටන් එම සාමාජිකත්ව ලේඛණය පමණක් පක්ෂයේ සාමාජිකත්ව ලේඛණය ලෙස සැළකිය යුතුය.

**5.3 ගරු සාමාජිකත්වය**

පක්ෂයේ මධ්‍යම කාරක සභාව වෙත යොමුකෙරෙන සාමාජික අයදුම්පත් සම්බන්ධයෙන් සළකා බැලීමේදී එම අයදුම්පතට අදාල පුද්ගලයාට ගරු සාමාජිකත්වය ලබා දියයුතු බවට මධ්‍යම කාරක සභාව විසින් තීරණය කළහොත් ඒ සාමාජිකත්වය ගරු සාමාජිකත්වයක් ලෙස සාමාජික නාම ලේඛණයේ දැක්වියයුතු අතර සාමාජික මුදල ගෙවීමෙන් නිදහස් විය යුතුය.

අදාල සාමාජිකත්ව අයදුම්පත ඉදිරිපත් කරන ලද පුද්ගලයා වෙත ඉහත කී ගරු සාමාජිකත්වය පිරිනැමීම පිළිබඳව වන දැන්වීම ලබාදිය යුතු අතර එම දැන්වීමේ සඳහන් දින හෝ ඊට පෙර අදාල සාමාජිකත්වය පිරිනැමීම එම පුද්ගලයා විසින් පිලිගත් බවට ලිඛිතව මධ්‍යම කාරක සභාවට දැනුම් දීමෙන් පසු එම සාමාජිකයා ගරු සාමාජිකයෙකු වශයෙන් සලකනු ලැබේ.

දෙන ලද කාලය තුළ අදාල ලිඛිත දැනුම් දීම මධ්‍යම කාරක සභාව වෙත ඉදිරිපත් නොකරන ලද සාමාජික ඉල්ලුම්පත්‍රයට ලබාදුන් මධ්‍යම කාරක සභා අනුමැතිය, අදාල දිනය ඉක්මයාමෙන් පසු අහෝසි ව යන්නේ ය. යළි සාමාජිකත්වය ඉල්ලුම් කිරීමට හෝ පිරිනැමීමට එකී අහෝසි වී යාම බාධාවක් නොවන්නේ ය.

5.4 පක්‍ෂයේ සාමාජිකත්වය ලබාගන්නා වූ සෑම අයෙකුම පක්ෂ ව්‍යවස්ථාව සම්බන්ධයෙන් දැනුවත් විය යුතු අතර "මම පක්‍ෂයේ පොදු ප්‍රතිපත්ති පොදු වැඩපිළිවෙලට එකඟ වෙමි. එහි අරමුණු හා ඉලක්ක සපුරා ගැනීමට ක්‍රියා කරමි. පක්‍ෂ ව්‍යවස්ථාවට අනුකූලව කටයුතු කරමි. පක්‍ෂයේ තීරණයන් ක්‍රියාවට නගමි"යන එකඟතාවය අයදුම්පත්‍රය සමග ඉදිරිපත් කළ යුතුය.

5.5 පක්‍ෂයෙන් ඉල්ලා අස්වීමට අවශ්‍ය වන පක්‍ෂයේ සාමාජිකයින් ඒ බව පක්‍ෂයේ මධ්‍යම කාරක සභාව වෙත ලිඛිතව දැන්විය යුතු අතර මධ්‍යම කාරක සභාවේ තීරණය පරිදි ඔහුගේ/ඇයගේ නම සාමාජික ලැයිස්තුවෙන් ඉවත් කළ යුතුය. ඒ සම්බන්ධයෙන් අදාල සාමාජිකයාට දැනුම්දීම ලේකම්වරයා විසින් සිදුකළ යුතු අතර එලෙස දැනුම් නොදීම සාමාජිකත්වය අවසන් නොවීමට හේතුවක් ලෙස නොසැළකිය යුතුය.

5.6 පක්‍ෂ සාමාජිකත්වය අහිමිවීම හෝ සාමාජිකත්වයෙන් ඉවත් කිරීම පහත සඳහන් පරිදි වියහැක.

i. සාමාජිකත්වය විසින් අදාල වර්ෂයේ වාර්ෂික පක්ෂ දායක මුදල, එම වසරේ ජනවාරි මස 31 වන දිනට පෙර අනිවාර්යයෙන්ම ගෙවිය යුතුය. එසේ නොවන විටකදී සාමාජිකත්වය අහිමි වේ. (යම් හෙයකින් අදාල වර්ෂයේ ජනවාරි මස 31 වන දිනට පසු සාමාජිකත්වය ලබාගන්නා අවස්ථාවකදී සාමාජික මුදල සහ අදාල වර්ෂයේ වාර්ෂික පක්ෂ දායක මුදල යන දෙකම එකවර ගෙවිය යුතුය.) මෙලෙස සාමාජිකත්වය අහිමි කිරීම පක්ෂ මධ්‍යම කාරක සභාව විසින් නිලවශයෙන් සිදු කළ යුතු අතර ඊට අදාල යෝජනාව පක්ෂයේ මුදල් ලේකම් විසින් එම වර්ෂයේ පෙබරවාරි මස

28වනදිනට පෙර පක්ෂ මධ්‍යම කාරක සභාවට දැන්විය යුතු අතර එම දැන්වීම සමග අදාල සාමාජිකයාට කරන ලද සිහිකැදවීමක් ද ඉදිරිපත් කළ යුතුය. එම සිහිකැදවීම ලියාපදිංචි තැපැලෙන් යවා තිබිය යුතුය.

ii. අදාල සිහිකැදවීම යැවීමෙන් පසු වැඩ කරන දින දහයක කාලයක් ඇතුළත ද අදාල සාමාජිකයා විසින් පක්ෂ සාමාජික මුදල සහ/හෝ දායක මුදල නොගෙවා ඇත්නම් ඊළග පක්ෂ මධ්‍යම කාරක සභාවේදී මුදල් ලේකම් වරයා විසින් ඒ බව දන්වා සිටිය යුතු අතර එම දැන්වීම අනුව එම සාමාජිකයාගේ සාමාජිකත්වය අහෝසි කිරීමට පක්ෂ මධ්‍යම කාරක සභාව කටයුතු කළ යුතුය. පක්ෂයේ ප්‍රධාන ලේකම් විසින් අදාල සාමාජිකයාට ඔහුගේ සාමාජිකත්වය අවසන් කිරීම හේතුව ද සමග දැන්විය යුතු අතර කෙසේ වෙතත් එම දැන්වීම නොලැබීම යන කාරණය මත සාමාජිකත්වය අහිමි කිරීමට පක්ෂ මධ්‍යම කාරක සභාව ගන්නා ලද තීරණය බල රහිත නොවිය යුතුය.

iii. පක්ෂ මධ්‍යම කාරක සභාව විසින් විනය හේතු මත පක්ෂ සාමාජිකත්වයෙන් ඉවත් කිරීමට ගන්නා ලද තිරණයකට අනුව සාමාජිකයෙකු සාමාජිකත්වයෙන් ඉවත් කල හැකිය. ඒ ඉවත්කිරීම මධ්‍යම කාරක සභාව විසින් තිදෙනෙකුට නොඅඩු පක්ෂ සාමාජිකයන් පිරිසකගෙන් සමන්විත විනය කමිටුවක් පත්කොට විනය පරීක්ෂණයක් පවත්වා අදාල සාමාජිකයාට නිදහසට කරුනු ඉදිරිපත් කිරීමේ අවස්ථාව ලබාදීමෙන් පසුව සකස් කරනු ලැබූ විනය කමිටු වාර්තාවේ නිර්දේශ අනුව විය යුතුය.

iv. අදාල විනය කටයුත්තට ලක්වන පුද්ගලයා මධ්‍යම කාරක සභාවේ සාමාජිකයකුවන අවස්ථාවක එම විනය කමිටුව පත්කිරීමේ කාර්යය සාකච්ඡා කරන මධ්‍යම කාරක සභාවට එම පුද්ගලයාට සහභාගිවීම නොකළ යුතුය.

v. එම විනය කමිටුවේ තීරණයකට එරෙහිව අභියාචනයක් ඉදිරිපත් කරනු ලබන චූදිත පුද්ගලයෙක් දින 14ක් ඇතුලත තම අභියාචනය පක්ෂ ලේකම් වරයා වෙත ලිඛිතව ඉදිරිපත් කළ යුතුය. පක්ෂ ලේකම්වරයා විසින් එවැනි අභියාචනයක් ලද පසු එය විභාග කිරීම සඳහා සුදුසු අභියාචනා මණ්ඩලයක් පත් කර එම මණ්ඩලයට එකී අභියාචනය යොමු කළ යුතුය. එලෙස යොමු කළ අභියාචනය සම්බන්ධයෙන් කටයුතු කළ යුතු ආකාරය හා අභියාචනය විමර්ශනය කළ යුතු ආකාරය පක්ෂ මධ්‍යම කාරක සභාව විසින් තීරණය කරනු ලැබිය යුතුය.

## 06 පක්ෂයේ සංවිධාන මූළධර්ම

(අ) ජනතා සේවක පක්ෂයේ සංවිධාන ක්‍රමවේදය ප්‍රජාතන්ත්‍රවාදී මධ්‍යගතභාවයයි. මේ ක්‍රමවේදය, පවතින දේශපාලන හා සංවිධානමය ඒකත්වයකින් යුතුව වර්ධනය කිරීම විසින් පක්ෂ අභ්‍යන්තරයේ සජීවී ප්‍රජාතන්ත්‍රවාදී පැවැත්ම ඉහළ හා පහළ සංවිධාන අතර සජීවී සබැදියාව සහ තනි තනි සාමාජිකයාගේ මෙන්ම සාමූහික නායකත්වයේ තීරණ ක්‍රියාත්මක කිරීම පක්ෂයේ වගකීම විය යුතුය.

(ආ) පක්ෂයේ තනතුරු සඳහා නායකයින් තෝරාගනු ලබන්නේ වසර තුන(03) කට වරක් පවත්වන ජාතික සමුලුවේදී, සාමාජිකයින්ගේ ඡන්දයෙනි.

(ඇ) ජනතා සේවක පක්ෂය සමගියෙන් හා සටන් කාමීත්වයෙන් යුක්ත වූ සංවිධානයක් වන අතර එය කඩා බිඳ දැමීමේ උත්සාහයන් සඳහා කිසිදු ඉඩක් ලබා නොදෙනු ඇත. සියළුම පක්ෂ

සාමාජිකයන් පක්ෂයේ සියළු තීරණ පිළිගත යුතුය. පක්ෂයේ තීරණ ගැනීමේදී සුළුතරය බහුතරයේ තීරණයට එකඟ විය යුතුය. පහළ සංවිධාන විසින් ඉහළ සංවිධාන ගන්නා තීරණ ක්‍රියාත්මක කළ යුතුය.

(ඇ) ජනතා සේවක පක්ෂයට ඇත්තේ පක්ෂ සභාපතිවරයාගේ ප්‍රධානත්වයෙන් යුත් සාමූහික නායකත්වයකි. එම සාමූහික නායකත්වය පක්ෂ මහ සම්මේලනයකදී තෝරා ගැනෙන සාමාජිකයන් 31 දෙනෙකුගෙන් යුත් මධ්‍යම කාරක සභාව මගින් නියෝජනය කළ යුතුය. මධ්‍යම කාරක සභාවේ තනතුරු ද මහා සම්මේලනය විසින් තෝරා ගත යුතුය.

(ඉ) පක්ෂයේ සහෝදරත්වය හා සමගිය පවත්වාගෙනයාම පිණිසත්, විනය ආරක්ෂා කිරීම පිණිසත් විවේචනය හා ස්වයං විවේචනය උපයෝගී කරගනු ලැබේ.

## 07 පක්ෂ ව්‍යුහය

### 7.1 ජාතික මහා සම්මේලනය

i. පක්ෂයේ උත්තරීතර ආයතනය ජාතික මහා සම්මේලනයයි.

ii. සාමාන්‍ය තත්වයන් යටතේ වසර තුන(03)කට වරක් පක්ෂ ජාතික මහා සම්මේලනය පවත්වනු ලැබිය යුතුය.

iii. ජාතික මහා සම්මේලන දෙකක් අතර තීරණ ගැනීමේ බලය මධ්‍යම කාරක සභාවට ද, මධ්‍යම කාරක සභා දෙකක් අතර තීරණ ගැනීම දේශපාලන මණ්ඩලයට ද පැවරේ.

iv. පක්ෂ ජාතික මහා සම්මේලනය පැවැත්වෙන දිනය පිළිබඳව සාමාජිකයින්ට දින 10කට නොඅඩු කාලයකට පෙර කාලානුරූපව සුදුසු ක්‍රමවේදයක් භාවිතා කරමින් දැනුම්දිය යුතුය.

v. මධ්‍යම කාරක සභාවේ බහුතර තීරණය පරිදි හෝ පක්ෂයේ පූර්ණ සාමාජිකත්වයෙන් තුනෙන් දෙකකගේ (2/3) අත්සනින් යුතුව ලිඛිත ඉල්ලීමක් ලේකම්වරයා වෙත හෝ පක්ෂයේ මධ්‍යම කාරක සභාව වෙත යොමු කිරීමෙන් එම ඉල්ලීම කර දින 15 ක් ඇතුළත විශේෂ සම්මේලන වාරයක් පැවැත්විය යුතුය. එම සම්මේලන වාරයේ වැඩකටයුතු විශේෂ සම්මේලන වාරය කැඳවීමට හේතු වූ සුවිශේෂී කරුණට පමණක් සීමාවිය යුතුය.

vi. ජාතික මහා සම්මේලන පවත්වන දිනය, වේලාව, සම්මේලනයේ වැඩපිළිවෙල, සම්මේලනයට ඉදිරිපත් කරන ලියවිලි පිළිබඳව තීරණය කිරීමේ බලය මධ්‍යම කාරක සභාව සතුය.

vii. වසර තුන(03)ක් ඉක්ම යාමට පෙර සම්මේලනය පැවැත්වීමේ ප්‍රායෝගික දුෂ්කරතාවයන් මතු වූ විටකදී ජාතික මහා සම්මේලනය උපරිම වශයෙන් එක් වර්ෂයක කාලයක් සඳහා කල්තැබීමේ හෝ වෙනත් සුදුසු විකල්ප ක්‍රමවේදයකට අනුව සම්මේලනය පැවැත්වීමේ තීරක බලය මධ්‍යම කාරක සභාව සතු වේ.

viii. ජාතික මහා සම්මේලනයේ ගණ පූර්ණය, සම්මේලනය පැවැත්වීමේ තීරණය ගනු ලබන දිනය වනවිට සිටින පක්ෂයේ සාමාජිකයන්ගෙන් හතරෙන් එකක් (1/4) විය යුතුය.

ix. ජාතික මහා සම්මේනයේදී පහත 7.2(ආ) යටතේ දැක්වෙන තනතුරු සහිත මධ්‍යම කාරක සභාව සඳහා සාමාජිකයින් 31 දෙනෙකු තෝරා පත් කර ගත යුතුය.

**7.2 මධ්‍යම කාරක සභාව**

(අ) පක්‍ෂයේ සියළුම ක්‍රියාකාරකම් වලට අදාල කළමණාකරන කටයුතු සහ මූල්‍ය පාලනයට අදාල සියළු කටයුතු පක්ෂ මධ්‍යම කාරක සභාවේ වගකීම වේ.

i. මධ්‍යම කාරක සභාවේ ගණ පූර්ණය සාමාජිකයින් 09 ක් විය යුතුය.

ii. පක්ෂයේ මධ්‍යම කාරක සභාව සාමාන්‍ය තත්වයයන් යටතේ මාස දෙකකට වරක්වත් රැස්විය යුතුය.

iii. පක්ෂයේ මධ්‍යම කාරක සභාව කැඳවීම පක්ෂයේ ලේකම්වරයා විසින් සිදු කළ යුතුය.

iv. පක්ෂයේ මධ්‍යම කාරක සභාවේ බහුතරය විසින් ලේකම්වරයා වෙත කරනු ලබන ඉල්ලීමකට අනුව ද පක්ෂ නායකයා විසින් උපදෙස් දෙනු ලබන ඕනෑම අවස්ථාවකදී ද පක්ෂ ලේකම්වරයා විසින් මධ්‍යම කාරක සභාව කැඳවිය යුතුය.

v. පක්ෂයේ ලේකම්වරයා විසින් ඉහත 04 පරිදි කැඳවීම සිදු නොකරන/අතපසුකරන අවස්ථාවකදී හෝ ලේකම්වරයාගෙන් ඒම කාර්යය ඉටු නොවන අවස්ථාවකදී එකී කැඳවීමේ බලය සභාපතිවරයාට හිමි වේ.

(ආ) ජාතික මහා සම්මේලනයේදී සාමාජික ඡන්දයෙන් මධ්‍යම කාරක සභිකයින් අතරින් තෝරාගන්නා නිලධාරි මණ්ඩලය පහත තනතුරුවලින් සමන්විත වේ.

i. සභාපති - පක්ෂයේ නායකත්වය දරනු ලබන්නේ සභාපතිවරයා විසිනි. පක්ෂයේ අරමුණු වෙනුවෙන් පක්ෂයේ මධ්‍යම කාරක සභාව විසින් ගන්නා ලද තීරණ ක්‍රියාත්මක කිරීම පිණිස පක්ෂය මෙහෙයවීම සහ මධ්‍යම කාරක සභාව මෙහෙයවීම සභාපතිවරයාගේ කාර්යය වන්නේ ය. දේශපාලන මණ්ඩලයේ, මධ්‍යම කාරක සභාවේ සහ පක්ෂ සම්මේලනයන්හි මූලාසනය දැරීම සභාපතිවරයා විසින් සිදුකළ යුතුය.

ii. ප්‍රධාන ලේකම් - දේශපාලන මණ්ඩලය, මධ්‍යම කාරක සභාව සහ පක්ෂ සම්මේලනයන් කැඳවීම සහ අවසන් කිරීම පක්ෂ ලේකම්වරයාගේ කාර්යය වන්නේ ය. පක්ෂයේ සෑම නිල රැස්වීම් වාරයකම වාර්තාවන් සකස් කිරීමත් සාමාජික නාම ලේඛණ සහ අත්සන් ලේඛණ නඩත්තු කිරීමත් කළ යුතුය. පක්ෂයේ වාර්තාවන් මැතිවරණ කොමසාරිස් වෙතත් අවශ්‍ය වෙනත් ආයතන වෙතත් නිසි කලට සැපයීම පක්ෂ ලේකම්වරයාගේ අනන්‍ය කාර්යයක් විය යුතු අතර ගණ පූරණය සහිත මධ්‍යම කාරක සභාවක පැමිණ සිටින සංඛ්‍යාවෙන් බහුතර අනුමැතිය සහිතව පක්ෂ ලේකම්වරයා විසින් කවර හෝ ආයතනයක් සමග කරනු ලබන ලිපි ගනුදෙනු අවසාන සහ තීරණාත්මක ලෙස සැළකිය යුතුය.

iii. උප සභාපති - සභාපතිවරයාගේ කටයුතු සඳහා සහය වීම ප්‍රධාන කාර්යය වේ. සභාපතිවරයාගේ ඉල්ලීම මත සභාපතිවරයා නියෝජනය කළ හැකිය.

iv. උප ලේකම් - ලේකම්වරයාගේ කටයුතු සඳහා සහය වීම ප්‍රධාන කාර්යය වේ.

v. ජාතික සංවිධායක - පක්ෂය ගන්නා ලද තීරණ සාර්ථක කරගැනීම සඳහා සාමාජිකත්වය මෙහෙයවීමත්, ජාතික මට්ටමින් පක්ෂය සංවිධානය කිරීම සහ පුළුල් කිරීමත්, බහුජන සංවිධාන කටයුතු සිදු කිරීමත් කළ යුතුය.

vi. මුදල් ලේකම් - පක්ෂයේ මූල්‍ය කටයුතු මෙහෙයවීමත්, අයවැය වාර්තා සකස් කිරීමත්, විගණන වාර්තා සකස් කිරීම සම්බන්ධීකරණය කිරීමත්, දෛනික වියදම් සඳහා අත් මුදල් භාරව සිටීමත් කළ යුතුය.

vii. ප්‍රචාරක ලේකම් - අවස්ථානුකූලව පක්ෂයේ මතය සමාජයට ඉදිරිපත් කිරීම සිදුකළ යුතුය. පක්ෂයේ සාමූහික දේශපාලන මතය සහ තීරණ සම්බන්ධයෙන් පෙනී සිටීම කළ යුතුය.

viii. අධ්‍යාපන ලේකම් - පක්ෂයත් සාමාජිකත්වයත්, පොදු සමාජයත් වෙනුවෙන් මධ්‍යම කාරක සභාවේ අනුමැතියට යටත්ව අදාල විෂය සම්බන්ධ කටයුතු සංවිධානය කිරීම සහ ක්‍රියාත්මක කිරීම කළ යුතුය.

ix. ජාත්‍යන්තර කටයුතු පිළිබඳ ලේකම් - පක්ෂයත් සාමාජිකත්වයත්, පොදු සමාජයත් වෙනුවෙන් මධ්‍යම කාරක සභාවේ අනුමැතියට යටත්ව අදාල විෂය සම්බන්ධ කටයුතු සංවිධානය කිරීම සහ ක්‍රියාත්මක කිරීම, ඒ ඒ රාජ්‍යයන් සමග සබඳතා ගොඩනගාගැනීම සහ පක්ෂය ජාත්‍යන්තර වශයෙන් සංවිධානය කිරීම කළ යුතුය.

x-xxxi මීට අමතරව තවත් කමිටු සාමාජිකයන් විසි දෙදෙනෙක්(22) - මධ්‍යම කාරක සභාව විසින් ඒ ඒ අවස්ථාවන්හිදී පවරනු ලබන කටයුතු සංවිධානය කිරීම සහ ක්‍රියාත්මක කිරීම කළ යුතුය.

(ඇ) මධ්‍යම කාරක සභාව විසින් එහි සභිකයින් අතරින් දිස්ත්‍රික් සංවිධායකයින්, කලාප සංවිධායකයින්, පළාත් සංවිධායකයින් අවශ්‍ය පරිදි පත්කරනු ලැබිය හැකිය.

(ඈ) මධ්‍යම කාරක සභාව විසින් නව තනතුරු ඇතිකල හැකි අතර ඒ තනතුරු සඳහා මධ්‍යම කාරක සභා සාමාජිකයන් අතුරින් සුදුස්සන් පත් කළ හැකිය. එකී පත්කිරීම් සඳහා එළඹෙන මහා සම්මේලනයේදී අනුමැතිය ලබාගත යුතුය.

(ඉ) පක්ෂයේ නිලධාරීන්ට හා මධ්‍යම කාරක සභිකයින්ට පැවරෙන වගකීම වරින් වර මධ්‍යම කාරක සභාව විසින් පවරනු ඇත. යම් නිලයකින් අයෙක් ඉල්ලා අස් වූ විට, නොපැමිණි විට, හෝ වෙනයම් කරුණක් නිසා නිලයක් පුරප්පාඩු වූ විට එය මධ්‍යම කාරක සභාවේ අනුමැතිය ඇතිව මධ්‍යම කාරක සභාව තුලින්ම අයෙක් තෝරා අදාල පුරප්පාඩුව හෝ කාර්ය ආවරණය කිරීමට මධ්‍යම කාරක සභාවට බලය ඇත. තවද එකී පුරප්පාඩුව සඳහා කෙරෙන පත්කිරීම් ඊළග මහා සම්මේලනය වන තෙක් වලංගු වේ. මධ්‍යම කාරක සභාවේ යම් තනතුරක් සඳහා පත්කිරීම තාවකාලිකව නොකළ යුතුයයි ගණ පූරණය සහිත මධ්‍යම කාරක සභාවක පැමිණ සිටින සංඛ්‍යාවෙන් බහුතරය තීරණය කරන ලද විටක එම තනතුර හිස්ව තැබීම හෝ මහා සම්මේලනයේදී එම තනතුර සඳහා නාම යෝජනා නොකැඳවීමට මධ්‍යම කාරක සභාවට බලය ඇත.

(ඊ) මධ්‍යම කාරක සභාවේ පුරප්පාඩුවක් ඇති වූ අවස්ථාවක ගණ පූරණය සහිත මධ්‍යම කාරක සභාවක පැමිණ සිටින සංඛ්‍යාවෙන් බහුතර අනුමැතිය ඇතිව මධ්‍යම කාරක සභාවට බාහිරින් වූ පුද්ගලයකු මධ්‍යම කාරක සභාවට ඇතුළත් කර ගැනීමට බලය ඇත. එකී පත්කිරීම් ඊළග මහා සම්මේලනය වන තෙක් වලංගු වේ.

(උ) මධ්‍යම කාරක සභාවේ සාමාජිකයෙකු තම වගකීම පැහැර හරින්නේ නම් ඒ සාමාජිකයා සම්බන්ධයෙන් තීරණ ගැනීමේ සහ විනය ක්‍රියාමාර්ග ගැනීමේ බලය මධ්‍යම කාරක සභාව සතු වේ.

**7.3 දේශපාලන මණ්ඩලය**

පක්ෂයේ දේශපාලන මණ්ඩලය සාමාජිකයින් හත්(07) දෙනෙකුගෙන් සමන්විත වේ. පක්ෂ සභාපති, ප්‍රධාන ලේකම්, මුදල් ලේකම්, ජාතික සංවිධායක සහ ඒ අය විසින් තෝරාගනු ලබන මධ්‍යම කාරක සභා සාමාජිකයන් තිදෙනෙකු යන අය එහි සාමාජිකයන් වේ. මධ්‍යම කාරක සභාව වෙතින් තෝරාගනු ලබන සාමාජිකයන්ගේ දේශපාලන මණ්ඩල සාමාජිකත්වය අහෝසි කිරීමේ සහ /හෝ ආදේශ කිරීමේ සහ/හෝ අත්හිටුවීමේ බලය ද දේශපාලන මණ්ඩලයේ අනෙකුත් සාමාජිකයන් සතු වේ.

**7.4 විෂයානුබද්ධ අනු කමිටු, ප්‍රාදේශීය කමිටු සහ කනිෂ්ඨ සංවිධාන**

(අ) පක්ෂ ව්‍යවස්ථාව විසින් ස්ථාපිත කර ඇති සහ පක්‍ෂයේ මධ්‍යම කාරක සභාව විසින් කලින් කලට ස්ථාපිත කරනු ලැබිය හැකි විෂයානුබද්ධ අනු කමිටුවලින් පක්ෂය සමන්විත වියයුතුය. මෙම අනුකමිටු පක්ෂයේ කාර්යය පහසු කරවීම සඳහා සහ වඩාත් කාර්යක්ෂම කිරීම සඳහා ඇති කරගනු ලබන අතර ඒවා අදාල අනුකමිටු ලේකම්වරයාගේ ප්‍රධානත්වයෙන් රැස්වීම, තීරණ ගැනීම සහ කටයුතුකිරීම සිදු කළ යුතුය.

කෙසේ වෙතත් පක්ෂ ව්‍යවස්ථාවට අනුගත නොවන තීරණ සහ පක්ෂ ව්‍යවස්ථාව හෝ මධ්‍යම කාරක සභාව විසින් නියම කරනු ලබන වපසරියට යටත් නොවන තීරණ ගැනීමට මෙම අනුකමිටුවලට බලයක් නොතිබියයුතු අතර එලෙස ගනු ලැබූ තීරණ බවට පක්ෂ මධ්‍යම කාරක සභාව විසින් තීරණය කරනු ලබන තීරණ සහ ඒ අනුව ගන්නා ලද සියළු ක්‍රියාමාර්ග අවලංගු සහ බලරහිත විය යුතුය.

(ආ) අවශ්‍යතාව පරිදි දිස්ත්‍රික් බල මණ්ඩල, දිසා කමිටු, ආයතන කමිටු, සංවිධාන කමිටු සහ බල මණ්ඩල ස්ථාපිත කළ යුතුය.

(ඇ) ඒ පිහිටුවීම සහ පවත්වාගෙන යාම සම්බන්ධයෙන් මධ්‍යම කාරක සභාව විසින් කලින් කලට තීරණ ගත හැකිය.

## 08. මුදල් පරිහරණය

i. පක්‍ෂයේ සියළුම මුදල් පාලනය මධ්‍යම කාරක සභාව සතු වුවද, මධ්‍යම කාරක සභාවේ අනුමැතිය හා උපදෙස් මත මුදල් පරිහරණය කිරීමේ වගකීම මුදල් ලේකම් වෙත පැවරේ.

ii. පක්‍ෂයේ නමින් මධ්‍යම කාරක සභාව තීරණය කරනු ලබන බැංකුවක ගිණුමක් මඟින් මුදල් ගනුදෙනු පවත්වාගෙන යා යුතුය. පක්‍ෂය වෙත ලැබෙන මුදල් වලින් මධ්‍යම කාරක සභාව විසින් තීරණය කරනු ලබන අත් මුදල් ප්‍රමාණයට අතිරික්ත මුදල් සෑම විටම බැංකු ගිණුමේ තැන්පත් කළ යුතුය.

iii. පක්‍ෂය වෙත ලැබෙන සෑම මුදලක්ම මුදල් ලේකම් වෙත යොමු කළ යුතු අතර එලෙස යොමු කරන ලද සෑම මුදලක් සඳහාම මුදල් ලේකම්ගේ හෝ ඔහු වෙනුවෙන් බලය ලත් අයෙකුගේ අත්සන සහිත රිසිට්පතක් නිකුත් කළ යුතුය.

iv. පක්ෂයේ ගිණුමෙන් මුදල් ලබා ගැනීමට අවශ්‍ය වන්නේ නම්, අනුමත කරන ලද ගෙවීම් වවුචරයක් මත, මුදල් ලේකම් සමග සභාපති හෝ ප්‍රධාන ලේකම් දෙදෙනාගෙන් එක් අයෙකු විසින් වවුචරවලට, චෙක්පත් වලට සහ මුදල් ලබාගැනීමේ පෝරමයන්ට අත්සන් කළ යුතුය.

v. මුදල් ලැබීම හා වියදම් පිළිබඳව සියළු ලිපි ලේඛන හා වාර්තා සැකසීම හා පවත්වාගෙන යාම මුදල් ලේකම් විසින් කළ යුතුය.

vi. වාර්ෂික අය වැය වාර්තාව පක්ෂයේ මධ්‍යම කාරක සභාව විසින් නම් කරන ලද විගණක නිළධාරියෙකු විසින් අනුමත කළ යුතුය.

vii. අනුමත කරන ලද වාර්ෂික අයවැය වාර්තාව මධ්‍යම කාරක සභාවට ඉදිරිපත් කළ යුතුය.

## 09. පක්ෂ විනය

i. පක්ෂයේ සමගිය රැක ගැනීමටත්. ශක්තිමත් කිරීමටත්, පක්ෂයේ ශක්තිය වැඩි දියුණු කිරීමටත්, එහි ජයග්‍රහණයන් හැකියාවන් හා ගරුත්වය රැක ගැනීමටත්, පක්ෂ ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීමටත් පක්ෂ විනය අනිවාර්යයෙන්ම අවශ්‍ය වේ. විනයකින් තොරව පක්ෂයේ අරමුණු සාක්ෂාත් කර ගත නොහැකිය. පක්ෂයේ ප්‍රතිපත්ති, වැඩ පිළිවෙල හා ඉලක්කයන් පක්ෂයේ ක්‍රියාමාර්ග හා පක්ෂයේ ක්‍රියාකාරීත්වය පිළිබඳව දැනුවත්ව කරන පිළිගැනීම මත පක්ෂ විනය පදනම් වේ. පක්ෂ සංවිධානය තුළ සහ ප්‍රසිද්ධ ජන ජීවිතයේ යමෙකු දරණ ස්ථානය නොතකා සෑම පක්ෂ සාමාජිකයෙකු කෙරෙහිම පක්ෂ විනය ඒකාකාරී ලෙස බලපායි. පක්ෂ ව්‍යවස්ථාව, පක්ෂ තීරණ හා පක්ෂ ප්‍රතිපත්තීන් උල්ලංඝනය කොට කටයුතු කිරීම පක්ෂ විනය කැඩීමක් සේ සලකනු ලබයි.

ii. යමෙකු පක්ෂ විනය උල්ලංඝනය කර ඇතැයි යන්න මධ්‍යම කාරක සභාවට ඒත්තු ගියහොත් හෝ පැමිණිල්ලක් ලැබුණහොත් ඒ සම්බන්ධයෙන් ඔහුට හෝ ඇයට චෝදනා පත්‍රයක් මධ්‍යම කාරක සභාවේ අනුමැති සහිතව පක්ෂ ලේකම් වරයා විසින් ලබා දිය යුතු අතර, ඔහු හෝ ඇය එම චෝදනාවන්ට තම පිළිතුරු පක්ෂ ලේකම්වරයා විසින් චෝදනා පත්‍රයෙහි සඳහන් කර ඇති කාලය ඇතුලත ලබා දිය යුතුය. එකී පිළිතුරෙන් සෑහීමකට පත් විය නොහැකි බවට මධ්‍යම කාරක සභාව තීරණය කළහොත් ඔහු හෝ ඇය පිළිබඳව 5.6.iii, iv, v වගන්තිවල ප්‍රතිපාදන අදාල වේ.

iii. කෙසේ වෙතත් යමෙකු පක්ෂ විනය උල්ලංඝනය කර ඇතැයි යන්න පක්ෂයේ දේශපාලන මණ්ඩලයට ඒත්තු යන හෝ දැනගැනීමට ලැබෙන හෝ සන්නිවේදනය වන අවස්ථාවක ඊළඟ මධ්‍යම කාරක සභාවේදී අපරානුමැතිය ලබාගැනීමට යටත්ව එම සාමාජිකයාගේ පක්ෂ සාමාජිකත්වය තාවකාලිකව අත්හිටුවීම, එම සාමාජිකයා දරණු ලබන වගකීම්/තනතුරුවලින් තාවකාලිකව ඉවත් කිරීම සහ/හෝ එම වගකීම්/තනතුරුවල කාර්යය තාවකාලිකව අත්හිටුවීම යන සියල්ල හෝ සුදුසු එක් පියවරක් හෝ පියවර කිහිපයක් ගැනීමේ බලය දේශපාලන මණ්ඩලය සතු වන්නේ ය.

## 10. අතුරු නීති සහ ව්‍යවස්ථා සංශෝධනය

i. අවශ්‍ය තැන්හිදී අතුරු නීති පැනවීමේ අයිතිය මධ්‍යම කාරක සභාව සතුය. එලෙස පනවන අතුරු නීති පක්ෂයේ ඊළග මහා සම්මේලනය විසින් අනුමත කිරීම හෝ ප්‍රතික්ෂේප කිරීම කළ හැකිය. කෙසේ වෙතත් ඊළග මහා සම්මේලනය විසින් ප්‍රතික්ෂේප කරන ලද අවස්ථාක දී එලෙස ප්‍රතික්ෂේප කරනු ලබන තෙක් එකී අතුරු නීති භාවිතා කරමින් කරන ලද කාර්යයන් හි වලංගුතාවයට එකී ප්‍රතික්ෂේප කිරීම කිසිදු බලපෑමක් කරන ලද සේ නොසැළකිය යුතුය.

ii. පක්ෂයේ නම, මැතිවරණ ලකුණ, ධජය ඇතුළු පක්ෂ ව්‍යවස්ථාව හෝ පක්ෂ ව්‍යවස්ථාවේ අන්තර්ගතය වෙනස් කිරීම හා සංශෝධනය කිරීමේ බලය ඇත්තේ, පක්ෂයේ මහා සම්මේලනයට පමණි. ඊට අදාල යෝජනා මහා සම්මේලනයට හෝ විශේෂ මහ සම්මේලනයට ඉදිරිපත් කිරීම පක්ෂ මධ්‍යම කාරක සභාව විසින් කළ යුතුය. අවශ්‍ය විටෙක විශේෂ සමුළුවක් පවත්වා ඉහත සංශෝධනයන් කිරීමේ හැකියාව මෙ මගින් අහෝසි නොකෙරේ.

## 11. මැතිවරණය සඳහා අපේක්ෂකයන් තෝරා පත් කර ගැනීම

මැතිවරණයකට අපේක්ෂකයන් තෝරා ගැනීම සඳහා මධ්‍යම කාරක  සභාව විසින් මැතිවරණ කමිටුවක් මධ්‍යම කාරක  සභිකයින් අතරින් තෝරා පත් කර ගත යුතුය. ඉදිරිපත් වී ඇති අයදුම්පත්  සලකා බලා සුදුසු අපේක්ෂකයන් මධ්‍යම කාරක  සභාව වෙත යෝජනා කිරීම මෙම කමිටුව විසින් කළ යුතුය. එම යෝජනා අනුව අපේක්ෂකයින් තීරණය කිරීමේ අවසාන බලය මධ්‍යම කාරක  සභාව සතුය.

## 12. අර්ථ නිරූපණය

ව්‍යවස්ථා සම්බන්ධ අර්ථ නිරූපණය කිරීමේ බලය හා ව්‍යවස්ථාව නිහඩ තැන්හිදී සුදුසු තීරණ ගෙන කටයුතු කිරීමේ පූර්ණ බලය, ගණ පූරණය සහිත මධ්‍යම කාරක සභාවක පැමිණ සිටින සංඛ්‍යාවෙන් බහුතරය සතුය.

26.8.23

පක්ෂයේ සභාපති

සභාපති
ජනතා සේවක පක්ෂය

පක්ෂයේ ලේකම්

.....................................
ලේකම්
ජනතා සේවක පක්ෂය